# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,922/7 — 1970 සැප්තැම්බර් 11 වැනි සිකුරාදා — 1970.9.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

ඇල්. ඩී.—බී 27/39

### ගම්සභා ආඥපනත

#### ආඥව

(257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥපනතේ 5 වැනි සහ 10 වැනි වගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු වැඩබලන ඇමති විලියම් නීල් ද අල්විස් වන මම මෙම ආඥවෙන්—

(1) උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ කරායිතිව් නම් ප්‍රදේශය මෙහි වූ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති පරිදි කරෙයිනගර් උතුර සහ කරෙයිනගර් දකුණ යනුවෙන් නව ගම් ප්‍රදේශ දෙකකට බෙද වෙන් කරමි; තවද

(2) ඉහතකී කරෙයිනගර් උතුර සහ කරෙයිනගර් දකුණ යන ගම් ප්‍රදේශයන් සඳහා සංස්ථාපනය කරනු ලබන ගම් සභාවල නිල කාලය ආරම්භ වන දිනය වශයෙන් 1971 ජනවාරි මස පළමුවන දිනය නියම කරමි.

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු වැඩබලන ඇමති.

1970 . 9 . 10 දින
කොළඹදීය.

#### උපලේඛනය

ග්‍රාම සේවක කොට්ඨාශ අංක 10ඒ කරෙයිනගර් උතුර සහ ඕඩෙයිතේරු වංගුව අසලදී කල්ලන්තල්වූ ඇලේ මධ්‍ය රේඛාව හමුවන සේ උතුරු දෙසට ද, එතැන් සිට එකී ඇලේ මධ්‍ය රේඛාව ඔස්සේ සර්කියුලර් පාරේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ගිණිකොන දෙසට ද, එතැන් සිට එකී පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ වෙරටකුලමට සමාන්තර වනසේ ඇදි ලක්ෂ්‍යයක් හමුවනතුරු දකුණු දෙසට ද, එතැන් සිට වෙරටකුලම දක්වා සෘජු රේඛාවක් ඔස්සේ නැගෙනහිර දෙසට ද, එතැන් සිට කාලවිල් ඇලේ මධ්‍ය රේඛාව ඔස්සේ හා එහි දිග්ගැස්සිම ඔස්සේ මුහුද දක්වා නැගෙනගිර දෙසට ද, ඊශාන දෙසට ද, ගිණිකොන දෙසට ද අඳින ලද රේඛාවකින් උතුරින් පිහිටි අංක 9 කරෙයිනගර් බටහිර සහ අංක 10 කරෙයිනගර් නැගෙනහිර යන ග්‍රාම සේවක කොට්ඨාශවල කොටස් වලින් සමන්විත කරෙයිනගර් උතුර ගම් ප්‍රදේශය.

ඕඩෙයිතේරු වංගුව අසලදී කල්ලන්තල්ලු ඇලේ මධ්‍ය රේඛාව හමුවන සේ උතුරු දෙසට ද, එතැන් සිට එකී ඇලේ මධ්‍ය රේඛාව ඔස්සේ සර්කියුලර් පාරේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ගිණිකොන දෙසට ද, එතැන් සිට එකී පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ වෙරටකුලමට සමාන්තර වනසේ ලක්ෂ්‍යයක් හමුවන තුරු දකුණු දෙසට ද, එතැන් සිට වෙරටකුලම දක්වා සෘජු රේඛාවක් ඔස්සේ නැගෙනහිර දෙසට ද, එතැන් සිට කාලවිල් ඇලේ මධ්‍ය රේඛාව ඔස්සේ හා එහි දිග් ගැස්සිම ඔස්සේ මුහුද දක්වා නැගෙනහිර දෙසටද, ඊශාන දෙසට ද, ගිණිකොන දෙසට ද අඳින ලද රේඛාවකින් දකුණට පිහිටි අංක 9 කරෙයිනගර් බටහිර හා අංක 10 කරෙයිනගර් නැගෙනහිර යන ග්‍රාම සේවක කොට්ඨාශවල කොටස් වලින් සමන්විත කරෙයිනගර් දකුණු ගම් ප්‍රදේශය.

9—760/1

---

ඇල්. ඩී.—බී 27/39

### ගම් සභා ආඥපනත

(257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥපනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු වැඩබලන ඇමති විලියම් නීල් ද අල්විස් වන මම මෙම නිවේදනයෙන්—

(1) උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ කරෙයිනගර් උතුර ගම් ප්‍රදේශය තුළ පිහිටි මෙහි වූ පළමුවැනි උපලේඛනයේ I වැනි තීරයේ සඳහන්ව ඇති දනට පවත්නා ඡන්ද කොට්ඨාශවල ඒකාබද්ධ ප්‍රදේශය එකී උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් සීමාවලින් යුක්තවූ නව ඡන්ද කොට්ඨාශවලට අනුකොටස් කර නැවත බෙද වෙන් කරමි;

(2) උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ කරෙයිනගර් දකුණ ගම් ප්‍රදේශය තුළ පිහිටි මෙහිවූ දෙවැනි උපලේඛනයේ I වැනි තීරයේ සඳහන්ව ඇති දනට පවත්නා ඡන්ද කොට්ඨාශවල ඒකාබද්ධ ප්‍රදේශය එකී උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් සීමාවලින් යුක්තවූ නව ඡන්ද කොට්ඨාශවලට අනුකොටස් කර නැවත බෙද වෙන් කරමි,

(3) මෙම නිවේදනයේ (1) සහ (2) වැනි ඡේදයන්හි විධිවිධාන—

(අ) ඒවා 1970 වර්ෂයේ පැවැත්වීමට නියමිත ඉහතකී කරෙයිනගර් උතුර සහ කරෙයිනගර් දකුණ යන එක් එක් ගම් ප්‍රදේශයන්හි ගම් සභාවන්ට සභිකයින් තෝරා පත්කර ගැනීමේ වහා ඡන්ද විමසීම සම්බන්ධයෙන් වූ යම් කරුණකට අදළ වන ප්‍රමාණයට මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වන දින සිට වලංගු විය යුතු යයි ද;

(ආ) ඒවා වෙනත් යම් කරුණකට අදළ වන ප්‍රමාණයට 1971 ජනවාරි මස 1 වැනි දින සිට වලංගු විය යුතුයයි ද

ප්‍රකාශ කරමි.

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු වැඩබලන ඇමති.

1970 සැප්තැම්බර් 10 දින
කොළඹදිය.

පළමුවැනි උපලේඛනය

කරයිනගර් උතුර ගම් සභා ප්‍රදේශ

| I වැනි තීරුව<br>දනට පවත්නා කොට්ඨාශ | II වැනි තීරුව<br>අලුත් කොට්ඨාශ |
|---|---|
| | කොට්ඨාශ අංක 1—වෙතරදයිප්පු |
| අංක 9 කරයිනගර් බටහිර<br>අංක 10 කරයිනගර් නැගෙනහිර<br>අංක 10ඒ කරයිනගර් උතුර ... | උතුර : ගම් සභා ප්‍රදේශයේ උතුරු සීමාවේ පිහිටි කෝවිලම් ප්‍රදීපාගාරය අසළ ලක්ෂ්‍යයක සිට එම සීමාව ඔස්සේ ඉලන්තයිවාලයි පටුමහ කෙළවර සිට උතුරු දෙසට අඳින ලද රේඛාවක් මත ලක්ෂ්‍යයක් හමුවන තෙක් නැගෙනහිර දෙසට අඳින ලද රේඛාවකින්. |

නැගෙනහිරට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට ඍජු රේඛාවක් ඔස්සේ ඉලන්තයිවාලයි පටුමගේ මධ්‍යය දක්වා දකුණු දෙසට ද එතැන් සිට එම පටුමගේ මධ්‍යම රේඛාව ඔස්සේ අලන්තාලලයි–මෙයිහන්දි පාදසාලෙයි පටුමහ හා කලින් කී පටුමහ සන්ධි වන ස්ථානය දක්වා නිරිතදිග දෙසට ද අඳින ලද රේඛාවකින්.

දකුණට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට කරපෝරියාල් පටුමහ හමුවන තෙක් බටහිර දෙසට ද, ඊශාන දෙසට ද, එතැන් සිට කරපෝරියාල් පටුමගේ මධ්‍යම රේඛාව ඔස්සේ කෝවිලම් පාර හා සන්ධි වන ස්ථාන මධ්‍යය දක්වා යලිත් නිරිතදිග දෙසට ද අඳින ලද රේඛාවකින්.

බටහිරට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට කෝවිලම් පාරේ මධ්‍යම රේඛාව ඔස්සේ කොට්ඨාශයේ උතුරු සීමාව ආරම්භ වන ලක්ෂ්‍යය දක්වා වයඹ දෙසට අඳින ලද රේඛාවකින්.

කොට්ඨාශ අංක 2—රත්ලාඩි

උතුරට : මුල්ලපුලරු පාර සහ අලන්කාලෙයි—මෙයිහන්දි පාදසාලයි පාර සන්ධි වන ස්ථාන මධ්‍යයේ සිට එකී පටුමගේ මධ්‍යම රේඛාව ඔස්සේ සිවකාමි–අම්මාන් කෝවිල් පාර හා සන්ධි වන ස්ථානය දක්වා නැගෙනහිර දෙසට අඳින ලද රේඛාවකින්.

නැගෙනහිරට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට සිවකාමි අම්මාන් කෝවිල පාරේ මධ්‍යම රේඛාව ඔස්සේ වටරවුම පාර හා සන්ධි වන ස්ථානය දක්වා දකුණු දෙසට අඳින ලද රේඛාවකින්.

දකුණට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට වටරවුම පාරේ මධ්‍යම රේඛාව ඔස්සේ අලඩි සන්ධිය දක්වා බටහිර දෙසට අඳින ලද රේඛාවකින්.

බටහිරට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට කෝවිලම් පාරේ මධ්‍යම රේඛාව ඔස්සේ මුල්ලපිලාරු පාර හා සන්ධි වන ස්ථානය තෙක් උතුරු දෙසට හා වයඹ දෙසට ද එතැන් සිට එකී පාරේ මධ්‍යම රේඛාව ඔස්සේ කොට්ඨාශයේ උතුරු සීමාව ආරම්භ වන ලක්ෂ්‍යය දක්වා උතුරු දෙසට ද අඳින ලද රේඛාවකින්.

කොට්ඨාශ අංක 3—වීකාවිල්

උතුරට : සිවකාමි අම්මාන් කෝවිල පාර සහ අලන්තාලෙයි මෙයිහන්දි පාදසාලෙයි පාර සන්ධි ස්ථාන මධ්‍යයේ සිට පසුව කී පාරේ මධ්‍යම රේඛාව ඔස්සේ එය අල්ලිස් විදිය හා සන්ධි වන ස්ථාන මධ්‍යය දක්වා නැගෙනහිර දෙසට අඳින ලද රේඛාවකින්.

නැගෙනහිරට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අල්ලිස් වීදියේ මධ්‍යම රේඛාව ඔස්සේ එය වටරවුම පාර හා සන්ධි වන ස්ථානය දක්වා දකුණු දෙසට අඳින ලද රේඛාවකින්.

දකුණට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට වටරවුම පාරේ මධ්‍යම රේඛාව ඔස්සේ එය සිවකාමි අම්මාන් කෝවිල පාර හා සන්ධි වන ස්ථාන මධ්‍යය දක්වා බටහිර දෙසට අඳින ලද රේඛාවකින්

බටහිරට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට සිවකාමි අම්මාන් කෝවිල පාරේ මධ්‍යම රේඛාව ඔස්සේ කොට්ඨාශයේ උතුරු සීමාව පටන් ගන්නා ලක්ෂ්‍යය දක්වා උතුරු දෙසට අඳින ලද රේඛාවකින්.

කොට්ඨාශ අංක 4—සිත්තම්පරමූර්තු කර්නයිදි

උතුරට : අංක 1 කොට්ඨාශයේ උතුරු සීමාවේ උතුරු කෙළවර සිට ගම් සභා ප්‍රදේශයේ උතුරු සීමාව ඔස්සේ සුසාන භූමිය පාරේ සිට දිවෙන පටුමගේ මධ්‍ය රේඛාවේ නෙරුමෙහි ඊශාන දෙසට අඳින ලද රේඛාවක් හමුවන තෙක් නැගෙනහිර දෙසට අඳින ලද රේඛාවකින්.

නැගෙනහිරට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට සුසාන භූමිය පාරේ සිට දිවෙන පටුමගේ මධ්‍යම රේඛාව හමුවන ස්ථානය දක්වා සහ එකී පටුමගේ මධ්‍යම රේඛාව ඔස්සේ එම පටුමහ සුසාන භූමිය හා සන්ධි වන ස්ථානය දක්වා නිරිතදිග දෙසට ඍජු රේඛාවක් වශයෙන් ද, එතැන් සිට සුසාන භූමිය පාරේ මධ්‍යම රේඛාව ඔස්සේ එම පාර සිවාන් කෝවිල පාර හා සන්ධි වන ස්ථානය දක්වා ගිණිකොන දෙසට ද, එතැන් සිට සිවාන් කෝවිල පාරේ මධ්‍යම රේඛාව ඔස්සේ එය වටරවුම පාර හා සන්ධි වන ස්ථානය දක්වා දකුණු දෙසට ද අඳින ලද රේඛාවකින්.

දකුණට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට වටරවුම පාරේ මධ්‍යම රේඛාව ඔස්සේ අංක 3 දරන කොට්ඨාශයේ නැගෙනහිර සීමාව හමුවන තෙක් බටහිර දෙසට අඳින ලද රේඛාවකින්.

බටහිරට : අන්තිමට සඳහන් ලක්ෂ්‍යයේ සිට අංක 3 දරන කොට්ඨාශයේ නැගෙනහිර සහ උතුරු සීමාවන් ඔස්සේ උතුරු දෙසට හා බටහිර දෙසට ද, එතැන් සිට අංක 2 දරන කොට්ඨාශයේ නැගෙනහිර සීමාව ඔස්සේ එහි උතුරු කෙළවර දක්වා උතුරු දෙසට ද, එතැන් සිට අංක 2 දරන කොට්ඨාශයේ උතුරු සීමාව ඔස්සේ අංක 1 දරන කොට්ඨාශයේ නැගෙනහිර සීමාව හමුවන තෙක් නැගෙනහිර දෙසට ද, එතැන් සිට අංක 1 දරන කොට්ඨාශයේ නැගෙනහිර සීමාව ඔස්සේ එම කොට්ඨාශයේ උතුරු සීමාව පටන් ගන්නා ලක්ෂ්‍යය දක්වා උතුරු දෙසට ද අඳින ලද රේඛාවකින්.

| I වන තීරුව<br>දනට පවත්නා කොට්ඨාශ | II වන තීරුව<br>අලුත් කොට්ඨාශ |
| --- | --- |

**කොට්ඨාශ අංක 5—නීලිපන්තානෙයි**

උතුරට : අංක 4 දරන කොට්ඨාශයේ නැගෙනහිර මායිම පටන් ගන්නා ලක්ෂ්‍යයේ සිට ගම් ප්‍රදේශයේ උතුරු මායිම් ඔස්සේ කාසුරිනා වැල්ල පටුමගේ මධ්‍යම රේඛාවේ නෙරුම හමුවන ලක්ෂ්‍යය දක්වා ඊශාන දෙසට අඳින ලද රේඛාවකින්.

නැගෙනහිරට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට කාසුරිනා වැල්ල පටුමගේ මධ්‍යම රේඛාව දක්වා ඍජු රේඛාවක් ඔස්සේ සහ එම රේඛාව තවදුරට දීර්ඝ කරමින් යටකි පටුමගේ මධ්‍යම රේඛාව ඔස්සේ එය නාවුන්තේරු මලික්කායි පටුමග හා සන්ධි වන ස්ථානය දක්වා දකුණු දෙසට ද, එතැන් සිට නාවුන්තේරු මලික්කායි පටුමගේ මධ්‍යම රේඛාව ඔස්සේ එය වටුරවුම පාර හා සන්ධි වන ස්ථාන මධ්‍යය දක්වා ගිණිකොන දෙසට ද දකුණු දෙසට ද නිරිත දිග දෙසට ද යලිත් දකුණු දෙසට ද අඳින ලද රේඛාවකින් ;

දකුණට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට වටරවුම පාරේ මධ්‍යම රේඛාව ඔස්සේ අංක 4 දරන කොට්ඨාශයේ නැගෙනහිර සීමාව හමුවන තෙක් බටහිර දෙසට අඳින ලද රේඛාවකින් ;

බටහිරට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 4 දරන කොට්ඨාශයේ නැගෙනහිර සීමාව ඔස්සේ එහි උතුරු කෙළවර දක්වා උතුරු දෙසට දෙසට අඳින ලද රේඛාවකින්.

**කොට්ඨාශ අංක 6—මාපන ඌරි**

උතුරට සහ නැගෙනහිරට : අංක 5 දරන කොට්ඨාශයේ නැගෙනහිර සීමාවේ උතුරු කෙළවර පිහිටි ලක්ෂ්‍යයක සිට ගම් ප්‍රදේශයේ උතුරු සහ නැගෙනහිර සීමාවන් ඔස්සේ මූතාලි කර්නියාඩි පටුමගේ නෙරුමෙහි ලක්ෂ්‍යයක් හමුවන ස්ථානය දක්වා නැගෙනහිර දෙසට සහ දකුණු දෙසට ද අඳින ලද රේඛාවකින් ;

දකුණට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට මූතාලි කර්නියාඩි පටුමගේ, ඉල්ලකාඩි පටුමගේ සහ පෙරියමනල් පටුමගේ ද මධ්‍යම රේඛාවන් ඔස්සේ අංක 5 දරන කොට්ඨාශයේ නැගෙනහිර සීමාව හමුවන තෙක් බටහිර දෙසට, නිරිතදිග දෙසට සහ බටහිර දෙසට ද අඳින ලද රේඛාවකින්.

බටහිරට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 5 දරන කොට්ඨාශයේ නැගෙනහිර සීමාව ඔස්සේ කොට්ඨාශයේ උතුරු සහ නැගෙනහිර සීමාවන් ආරම්භ වන ලක්ෂ්‍යය දක්වා උතුරු දෙසට අඳින ලද රේඛාවකින්.

**කොට්ඨාශ අංක 7—වලත්කලෙයි**

උතුරට : අංක 6 දරන කොට්ඨාශයේ දකුණු සීමාවේ බටහිර කෙලවරේ සිට එම සීමාවේ නැගෙනහිර කෙළවර දක්වා නැගෙනහිර දෙසට අඳින ලද රේඛාවකින් ;

නැගෙනහිරට : ගම් ප්‍රදේශයේ නැගෙනහිර සීමාව ඔස්සේ, වටරවුම පාරේ මධ්‍ය රේඛාව හමුවනතෙක්, අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට දකුණු දෙසට අඳින ලද රේඛාවකින් ;

දකුණට : වටරවුම පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ අංක 5 කොට්ඨාශයේ නැගෙනහිර සීමාව හමුවන තෙක්, අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට බටහිර දෙසට අඳින ලද රේඛාවකින් ;

බටහිරට : අංක 5 කොට්ඨාශයේ නැගෙනහිර සීමාව ඔස්සේ, අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට කොට්ඨාශයේ උතුරු සීමාවේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා උතුරු දෙසට අඳින ලද රේඛාවකින්.

**කොට්ඨාශ අංක 8—වෙම්බඩි**

උතුරට හා නැගෙනහිරට : ගම් ප්‍රදේශයේ බටහිර සීමාවේ ලක්ෂ්‍යයක සිට කයිලකුලම් අසබඩ බෝක්කුවේ මධ්‍යය තෙක් නැගෙනහිර දෙසට අඳින ලද, ඔඩෙයිකාරෙයි–මනල්පිඩ්ඩි පටුමගෙයි මධ්‍ය රේඛාව තෙක් සහ එම පටුමගෙහි මධ්‍යම රේඛාව හා වෙම්බඩි පටුමග ඔස්සේ වෙම්බඩි හන්දිය දක්වා නැගෙනහිර හා දකුණු දෙසටද, ඉන්පසුව වටරවුම පාරේ මධ්‍යම රේඛාව ඔස්සේ සින්නලඩි දක්වා දකුණු දෙසටද දීර්ඝ කළ රේඛාවකින් ;

දකුණට : සින්නලඩි පටුමග හා පත්තර්කන්ඩි පටුමගේ මධ්‍යම රේඛාවක් ඔස්සේ ඔඩෙයිතේරු හමුවන තෙක් ද, ඉක්බිතිව වැල්ල ඔස්සේ උතුරට නැමමක් වනතුරු ඔඩෙයිතේරු ඔස්සේ බටහිර දක්වාද, ඉක්බිතිව ගම් ප්‍රදේශයේ බටහිර සීමාව තෙක් බටහිර දෙස දක්වා ඍජු රේඛාවක් වශයෙන්ද, අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට බටහිර දෙසට අඳින ලද රේඛාවකින් ;

බටහිරට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට කොට්ඨාශයේ උතුරු සීමාවේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා ගම් ප්‍රදේශයේ බටහිර සීමාව ඔස්සේ උතුරු දෙසට අඳින ලද රේඛාවකින්.

**කොට්ඨාශ අංක 9—කන්ගෝඩයි**

උතුරට : අංක 8 කොට්ඨාශයේ දකුණු සීමාවේ බටහිර කෙළවර සිට එම සීමාව ඔස්සේ එහි නැගෙනහිර කෙළවර දක්වා නැගෙනහිර දෙසට අඳින ලද රේඛාවකින් ;

නැගෙනහිරට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට වටරවුම පාරේ මධ්‍යම රේඛාව ඔස්සේ ගම් ප්‍රදේශයේ දකුණු සීමාව දක්වා දකුණු දෙසට අඳින ලද රේඛාවකින් ;

දකුණට හා බස්නාහිරට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට ගම් ප්‍රදේශයේ දකුණු සීමාව ඔස්සේ, කොට්ඨාශයේ උතුරු සීමාවේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා බටහිර හා වයඹ දෙසට අඳින ලද රේඛාවකින්.

**කොට්ඨාශ අංක 10—පයරිතුඩල්**

උතුරට : අංක 2 දරන කොට්ඨාශයේ දකුණු සීමාවේ බටහිර කෙලවර සිට අංක 2, 3 හා 4 යන කොට්ඨාශවල දකුණු සීමාවන් ඔස්සේ, සුබ්‍රමානියම් විද්‍යාශාලයට බටහිරෙන් පටුමග අරඹමින්, එයි සන්ධි ස්ථානයේ මධ්‍ය දක්වා නැගෙනහිර දෙසට අඳින ලදරේඛාවකින් ;

නැගෙනහිරට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට පටුමගෙහි මධ්‍යම රේඛාව ඔස්සේ දකුණු දෙසට අඳින ලද, ඇලේ මධ්‍යම රේඛාව හමු වනතුරුද, ඉක්බිතිව ඇලේ මධ්‍යම රේඛාව ඔස්සේ ගම් ප්‍රදේශයේ දකුණු සීමාව හමුවනතෙක් නැගෙනහිර හා දකුණු දෙසටද දීර්ඝ කරන ලද රේඛාවකින් ;

දකුණට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට ගම් ප්‍රදේශයේ දකුණු සීමාව ඔස්සේ වටරවුම පාරේ මධ්‍ය රේඛාව හමුවනතුරු බටහිර දෙසට අඳින ලද රේඛාවකින් ;

බටහිරට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට වටරවුම පාරේ මධ්‍යම රේඛාව ඔස්සේ කොට්ඨාශයේ උතුරු සීමාවේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා උතුරු දෙසට අඳින ලද රේඛාවකින්.

**කොට්ඨාශ අංක 11—මන්දිපුලම්**

උතුරට : අංක 10 දරන කොට්ඨාශයේ නැගෙනහිර සීමාවේ උතුරු කෙලවරේ සිට අංක 4, 5 හා 7 කොට්ඨාශවල දකුණු සීමාවන් ඔස්සේ ගම් ප්‍රදේශයේ නැගෙනහිර සීමාව හමුවන තුරු නැගෙනහිර දෙසට අඳින ලද රේඛාවකින් ;

නැගෙනහිරට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට ගම් ප්‍රදේශයේ නැගෙනහිර සීමාව ඔස්සේ ගම් ප්‍රදේශයේ දකුණු සීමාව හමුවන තුරු දකුණු දෙසට අඳින ලද රේඛාවකින් ;

I වන තීරය

දනට පවත්නා කොට්ඨාශ

II වන තීරය

අළුත් කොට්ඨාශ

දකුණට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට ගම් ප්‍රදේශයේ දකුණු සීමාව ඔස්සේ අංක 10 දරන කොට්ඨාශයේ නැගෙනහිර සීමාවන් හමුවෙනතුරු වයඹ සහ බටහිර දෙසට අඳින ලද රේඛාවකින්;

බටගිරට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 10 දරන කොට්ඨාශයේ නැගෙනහිර සීමාව ඔස්සේ, කොට්ඨාශයේ උතුරු සීමාවේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා උතුරට අඳින ලද රේඛාවකින්.

කොට්ඨාශ අංක 12—අයිලි

උතුරට : අංක 1 දරන කොට්ඨාශයේ බටහිර සීමාවේ උතුරු කෙලවර සිට එම සීමාව ඔස්සේ ගිණිකොන දිසාව දක්වා ද, අංක 2 කොට්ඨාශයේ බටහිර සීමාව හමුවන තෙක් අංක 1 කොට්ඨාශයේ දකුණු සීමාව ඔස්සේ ඊසාන සහ නැගෙනහිර දිසා දක්වාද අඳින ලද රේඛාවකින්;

නැගෙනහිරට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 2 දරන කොට්ඨාශයේ බටහිර සීමාව ඔස්සේ එහි දකුණු කෙළවර දක්වා දකුණු දෙසට අඳින ලද රේඛාවකින්,

දකුණට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 8 දරන කොට්ඨාශයේ නැගෙනහිර හා උතුරු සීමාවන් හමුවනතුරු අංක 10 දරන කොට්ඨාශයේ බටහිර සීමාවන් ඔස්සේ නිරිත දෙසටත්, ඉක්බිතිව, අංක 8 දරන කොට්ඨාශයේ උතුරු හා නැගෙනහිර සීමාවන් ඔස්සේ එහි බටහිර කෙළවර දක්වා වයඹ හා බටහිර දිසාවලට අඳින ලද රේඛාවකින්;

බටහිරට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට ගම් ප්‍රදේශයේ බටහිරට සීමාව ඔස්සෙ කොට්ඨාශයේ උතුරු සීමාවේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා උතුරු දෙසට අඳින ලද රේඛාවකින්.

## දෙවන උපලේඛනය

## කරෙයිනගර් දකුණ ගම් ප්‍රදේශය

I වන තීරය

දනට පවත්නා ඡන්ද කොට්ඨාශ

II වන තීරය

අළුත් ඡන්ද කොට්ඨාශ

අංක 9—කරෙයිනගර් බටහිර ...

අංක 10—කරෙයිනගර් නැගෙනහිර

අංක 1 දරණ ඡන්ද කොට්ඨාශය—පිඩිඩිපොලෙයි

උතුරට සහ නැගෙනහිරට : කාලිකෝවිල් පටුමග සහ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ නැගෙනහිර පාර හමුවන මංසන්ධියේ මධ්‍යයේ සිට එකී පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ ගම් ප්‍රදේශයේ උතුරු සීමාව පෙරියමාදවුහි දී හමුවන තෙක ඊශාන දෙසටද, එතැන් සිට ගම් ප්‍රදේශයේ උතුරු සහ නැගෙනහිර සීමාවන් ඔස්සේ නව පටුමග මධ්‍ය රේඛාව ඊශාන දෙසට දීර්ඝවී ගිය රේඛාවක් හමුවන තෙක් ගිණිකොණ දෙසටද ;

දකුණට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට ඍජු රේඛාවක් ඔස්සේ නව පටුමගේ මධ්‍ය රේඛාව තෙක් නිරිත දෙසටද, එතැන් සිට නව පටුමග මධ්‍ය රේඛාව ඔස්සේ තවදුරටත් ගොස් ඌරි මාවතේ අයිරිෂ් කාණුවේ මධ්‍ය රේඛාව හමුවන තෙක්ද එතැන් සිට ඌරි මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ කොට්ටපුලම් පටුමග හමුවන මංසන්ධියේ මැද දක්වා දකුණු දෙසටද, එතැන් සිට කොට්ටපුලම් පටුමග ඔස්සේ ඊශාන දෙසට තද වංගුවක් ගන්නා තුරු වයඹ දෙසට ඇඳි රේඛාවකින් ද ;

බස්නාහිරට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට කොට්ටපුලම් පටුමග මධ්‍ය රේඛාව ඔස්සේ එය ඌරි පාර හමුවන මංසන්ධියේ මැද දක්වා නැගෙනගිර දෙසටද එතැන් සිට එකී පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ එය පොන්නවලෙයි පාර එක්වන මංසන්ධියේ මැද දක්වා උතුරු දෙසටද එතැන් සිට එකී පාර ඔස්සේ කාලිකෝවිල් පටුමග මංසන්ධිය දක්වා බටහිර දෙසටද එතැන් සිට එකී පටුමග මධ්‍ය රේඛාව ඔස්සේ ඡන්ද කොට්ඨාශයේ උතුරු සහ නැගෙනහිර සීමාවන්හි ආරම්භක ලක්ෂ්‍යය දක්වා උතුරු දෙසට ඇඳි රේඛාවකින් ද වේ.

අංක 2 දරණ ඡන්ද කොට්ඨාශය—ඌරි

උතුරට : වාලුපොඩෙයි පටුමග සහ ඌරි මාවත එක්වන මංසන්ධියේ මධ්‍යයේ සිට එකී පාර මධ්‍ය රේඛාව ඔස්සේ අංක 1 දරණ ඡන්ද කොට්ඨාශයේ දකුණු සීමාව වී.සේ.ස.ස. මංසන්ධියේදී හමුවන තෙක් නැගෙනහිර දෙසද එතැන් සිට එකී සීමාව ඔස්සේ එහි නැගෙනහිර කෙළවර දක්වා නැගෙනහිර දෙසට ද ;

නැගෙනහිරට සහ දකුණට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට ගම් ප්‍රදේශයේ නැගෙනහිර සීමාව ඔස්සේ කේබල් නිවාසයට ඍජුව පිහිටි රේඛාවක් හමුවන තෙක් දකුණට හා නිරිත දෙසට ද ;

බටහිරට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට පාලවොදෙයි අම්මාන් කෝවිල පෙදෙසේ නැගෙනහිර මායිම ඔස්සේ ඌරි මාවතේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ඇඳි ඍජු රේඛාවක් ඔස්සේ උතුරු දෙසටද එකී පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ ඡන්ද කොට්ඨාශයේ උතුරු සීමාවේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා ඊශාන දෙසට ඇඳි රේඛාව කින් ද වේ.

අංක 3 දරණ ඡන්ද කොට්ඨාශය—පාලමෝදෙයි

උතුරට : එඩුකඩ්ඩි–පාලවෝදෙයි මංසන්ධිය මධ්‍යයේ සිට එඩුකඩ්ඩි පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ එහි කෙළවර දක්වා නැගෙනහිර දෙසටද එතැන් සිට කුඹුරු වෙල්යාය හරහා තික්කාරි කෝවිල් පෙදෙස නිරිතදිග කෙළවර දක්වා නැගෙනහිර දෙසට ඇඳි ඍජු රේඛාවකින්ද එතැන් සිට කුඹුරු වෙල්යාය හරහා වාලුපොඩෙයි පටුමග බටහිර කෙළවර දක්වා දකුණු දෙසට ඇඳි ඍජු රේඛාවකින්ද එතැන් සිට එම පටුමගේ මධ්‍ය රේඛාව ඔස්සේ අංක 2 දරණ ඡන්ද කොට්ඨාශයේ බටහිර සීමාව හමුවන තෙක් නැගෙනහිර දෙසට ඇඳි රේඛාවකින් දවේ.

නැගෙනහිරට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 2 දරණ ඡන්ද කොට්ඨාශයේ බටහිර සීමාව ඔස්සේ එහි දකුණු කෙළවර දක්වා දකුණු දෙසට ඇඳි රේඛාවකින් ද ;

දකුණට සහ බස්නාහිරට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට කුඹුරු වෙල්යාය හරහා අම්පිලා පටුමග කෙළවර දක්වා වයඹ දෙසට ඇඳි ඍජු රේඛාවකින්ද එතැන් සිට එම පටුමග මධ්‍ය රේඛාව ඔස්සේ එය පලාවෝඩෙයි පාර හමුවන මංසන්ධියේ මධ්‍යය දක්වා උතුරු දෙසට ඇඳි රේඛාවකින්ද එතැන් සිට එකී පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ ඡන්ද කොට්ඨාශයේ උතුරු කෙළවරේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා වයඹ දෙසට ඇඳි රේඛාවකින් ද වේ.

අංක 4 දරණ ඡන්ද කොට්ඨාශය—තොප්පුකඩු

උතුරට සහ නැගෙනහිරට : අංක 3 දරණ ඡන්ද කොට්ඨාශයේ දකුණු සහ බටහිර සීමාවේ තොප්පුකඩු මුරුගන් වී.සේ.ස.ස. පටුමග මධ්‍ය රේඛාවට දීර්ඝ වන සේ අඳින ලද ඍජු රේඛාවකින් කැපී යන ලක්ෂ්‍යයක සිට අංක 3 දරණ ඡන්ද කොට්ඨාශයේ දකුණු හා බටහිර සීමාවන් ඔස්සේ එහි දකුණු කෙළවර දක්වා නැගෙනහිර දෙසටද දකුණු දෙසට හා ගිණිකොණ දෙසට ඇඳි රේඛාවකින් ද ;

දකුණට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට ගම් ප්‍රදේශයේ දකුණු සීමාව ඔස්සේ තොප්පකඩු—මුරුගන් වී.සේ.ස.ස. පටුමග මධ්‍ය රේඛාවේ දකුණු දිගට පිහිදී ඇති දීර්ඝ කිරීමේ ලක්ෂ්‍යය හමුවන තෙක් බටහිර දෙසට ඇඳි රේඛාවකින් ද ;

I වන තීරය

දැනට පවත්නා ඡන්ද කොට්ඨාශ

II වන තීරය

අළුත් ඡන්ද කොට්ඨාශ

බස්නාහිරට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට තොප්පුකඩු—මුරුගන් වි.සේ.ස.ස. පටුමග මධ්‍ය රේඛාව හමුවන තෙක් උතුරු දෙසට අඳින ලද සෘජු රේඛාවකින්ද එතැන් සිට එකී මධ්‍ය රේඛාව ඔස්සේ ඡන්ද කොට්ඨාශයේ උතුරු සහ නැගෙනහිර සීමාවේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා උතුරු දෙසට දිගු කොට අඳින ලද රේඛාවකින් ද වේ.

**අංක 5 දරණ ඡන්ද කොට්ඨාශය— තුරෙයිමුවන්**

උතුරට : උඩුවිල් පටුමග සිට ඉඩුකඩ්ඩි පාරේ මධ්‍ය රේඛාවේ අංක 9 සහ 10 දරණ ග්‍රාමසේවක කොට්ඨාශ අතර පොදු මායිමේ සිට ගිණිකොණ දෙසට ඇඳි සෘජු රේඛාව කැපී යන ලක්ෂ්‍යයක සිට එකී සෘජු රේඛාව ඔස්සේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ නැගෙනහිර පාර සහ ඉඩුකඩ්ඩි පාර හමුවන මංසන්ධියේ මැද දක්වා ගිණිකොණ දෙසට ඇඳි රේඛාවකින්ද එතැන් සිට ඉඩුකඩ්ඩි පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ එය පාලවෝදෙයි පාර හා එක්වන මංසන්ධියේ මැද දක්වා ගිණිකොණ දෙසටද එතැන් සිට එකී පාර මධ්‍ය රේඛාව ඔස්සේ අංක 4 දරණ ඡන්ද කොට්ඨාශයේ බටහිර සීමාව හමුවන තෙක් ගිණිකොණ දෙසට ඇඳි රේඛාවකින් ද ;

නැගෙනහිරට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 4 දරණ ඡන්ද කොට්ඨාශයේ බටහිර කෙළවර ඔස්සේ එහි දකුණු කෙළවර දක්වා දකුණු දෙසට ඇඳි රේඛාවකින් ද ;

දකුණට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට ගම් ප්‍රදේශයේ දකුණු සීමාව ඔස්සේ අංක 9 සහ 10 දරණ ග්‍රාම සේවක කොට්ඨාශ අතර වූ පොදු මායිම හමුවන තෙක් බටහිර දෙසට ඇඳි රේඛාවකින් ද ;

බස්නාහිරට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 9 සහ 10 දරණ ග්‍රාම සේවක කොට්ඨාශවල පොදු මායිම ඔස්සේ ඡන්ද කොට්ඨාශයේ උතුරු සීමාවේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා උතුරු දෙසට ඇඳි රේඛාවකින් ද වේ.

**අංක 6 දරණ ඡන්ද කොට්ඨාශය—විලානෙයි**

උතුරට : අංක 9 සහ 10 දරණ ග්‍රාම සේවක කොට්ඨාශවල පොදු මායිම, කිලුවානේ ඇලේ මධ්‍ය රේඛාව හමුවන තෙක් කුඹුරු වෙල්යාය හරහා ගිණිකොණ දෙසට ඇඳි රේඛාවකින් කැපී යන ලක්ෂ්‍යයේ සිට එකී මධ්‍ය රේඛාව ඔස්සේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ නැගෙනහිර පාර හමුවන තෙක් නැගෙනහිර දෙසට ද එතැන් සිට කුඹුරු වෙල් ගැට්යේ රේඛාවක් ඔස්සේ කිලුවානේ ඉඩම බටහිර කෙළවර දක්වා ගිණිකොණ දෙසට ඇඳි රේඛාවකින් ද ;

නැගෙනහිරට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට කුඹුරු වෙලේ ගැට්ය ඔස්සේ තික්කාරි කෝවිල් ඉඩමේ බටහිර මුල්ල දක්වා ගිණිකොණ දෙසටද එතැන් සිට එකී කෝවිල් ඉඩමේ බටහිර මායිම ඔස්සේ අංක 3 දරණ ඡන්ද කොට්ඨාශයේ උතුරු සීමාව හමුවන තෙක් දකුණු දෙසට ඇඳි රේඛාවකින් ද ;

දකුණට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 3 සහ 5 දරණ ඡන්ද කොට්ඨාශවල උතුරු සීමාවන් ඔස්සේ ග්‍රාමසේවක කොට්ඨාශ අංක 9 සහ 10 අතර වූ පොදු මායිම හමුවන තෙක් බටහිර දෙසට ඇඳි රේඛාවකින් ද ;

බස්නාහිරට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 9 සහ 10 දරණ ග්‍රාමසේවක කොට්ඨාශවල පොදු මායිම ඔස්සේ ඡන්ද කොට්ඨාශයේ උතුරු සීමාවේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා උතුරු දෙසට ඇඳි රේඛාවකින් ද වේ.

**අංක 7 දරණ ඡන්ද කොට්ඨාශය—පොන්නවාලෙයි**

උතුරට : අංක 6 දරණ ඡන්ද කොට්ඨාශයේ නැගෙනහිර සීමාවේ උතුරු කෙළවර සිට කිලුවානෙයි පටුමග මධ්‍ය රේඛාව ඔස්සේ අංක 1 දරණ ඡන්ද කොට්ඨාශයේ බටහිර සීමාව හමුවන තෙක් නැගෙනහිර දෙසට ඇඳි රේඛාවකින් ද ;

නැගෙනහිරට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 1 දරණ ඡන්ද කොට්ඨාශයේ බටහිර සීමාව ඔස්සේ එහි දකුණු කෙළවර දක්වාද, එතැන් සිට අංක 1 දරණ ඡන්ද කොට්ඨාශයේ දකුණු සීමාව ඔස්සේ අංක 2 දරණ ඡන්ද කොට්ඨාශයේ උතුරු සීමාවේ වි.සේ.ස.ස. ගබඩා මංසන්ධිය හමුවන තෙක් ගිණිකොණ දෙසට ඇඳි රේඛාවකින් ද ;

දකුණට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 3 සහ 6 දරණ ඡන්ද කොට්ඨාශවල නැගෙනහිර සීමාව ඔස්සේ ඡන්ද කොට්ඨාශයේ උතුරු සීමාවේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා උතුරු දෙසට ඇඳි රේඛාවකින් දවේ.

බස්නාහිරට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 3 සහ 6 දරණ ඡන්ද කොට්ඨාශයන්හි නැගෙනහිර මායිම ඔස්සේ ඡන්ද කොට්ඨාශයේ උතුරු මායිමේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා උතුරු දෙසට ඇඳි රේඛාවකින් ද වේ.

**අංක 8 දරණ ඡන්ද කොට්ඨාශය—සාදිරාන්තෙයි සහ කරයිපිඩ්ඩියන්තනෙයි**

උතුරට : ගම් ප්‍රදේශයේ උතුරු සීමාව අංක 9 සහ 10 දරණ ග්‍රාම සේවක කොට්ඨාශ අතර වූ පොදු මායිමෙන් කැපී යන ලක්ෂ්‍යයේ සිට ගම් ප්‍රදේශයේ උතුරු සීමාව ඔස්සේ පෙරියමාදවු දක්වා නැගෙනහිර දෙසට ඇඳි රේඛාවකින් ද ;

නැගෙනහිරට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 1 දරණ ඡන්ද කොට්ඨාශයේ උතුරු හා නැගෙනහිර සීමාවන් ඔස්සේ එහි බටහිර කෙළවර දක්වා නිරිත දෙසටද එතැන් සිට අංක 1 දරණ ඡන්ද කොට්ඨාශයේ බටහිර සීමාව ඔස්සේ අංක 7 දරණ ඡන්ද කොට්ඨාශයේ උතුරු සීමාව හමුවන තෙක් දකුණු දෙසට ඇඳි රේඛාවකින් ද ;

දකුණට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 7 සහ 6 දරණ ඡන්ද කොට්ඨාශවල උතුරු සීමාවන් ඔස්සේ අංක 9 සහ 10 දරණ ග්‍රාම සේවක කොට්ඨාශය අතරවූ පොදු මායිම හමුවනතෙක් බටහිර දෙසට ඇඳි රේඛාවකින් ද ;

බස්නාහිරට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 9 සහ 10 දරන ග්‍රාම සේවක කොට්ඨාශය අතරවූ පොදු මායිම ඔස්සේ ඡන්ද කොට්ඨාශයේ උතුරු සීමාවේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා උතුරු දෙසට ඇඳි රේඛාවකින් ද වේ.

**අංක 9 දරන ඡන්ද කොට්ඨාශය—පලකඩු**

උතුරට : නම්බවාලි පටුමග මධ්‍ය රේඛාව දීර්ඝ කිරීමක සිට ගම් ප්‍රදේශයේ බටහිර සීමාව දක්වා බටහිර දෙසටද එම රේඛාව ඔස්සේ උඩුවිල් පටුමග සන්ධිස්ථානය දක්වා නැගෙනහිරට හා ගිණිකොන දෙසටද, එතැන් සිට එකී පටුමග මධ්‍ය රේඛාව සහ එකී රේඛාවේ දීර්ඝ කිරීම ඔස්සේ අංක 5 දරන ඡන්ද කොට්ඨාශන් බටහිර සීමාව හමුවනතෙක් ගිණිකොන දෙසට ඇඳි රේඛාවකි න් ද ;

නැගෙනහිරට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 5 දරන ඡන්ද කොට්ඨාශයේ බටහිර සීමාව ඔස්සේ එහි දකුණු කෙළවර දක්වා දකුණු දෙසට ඇඳි රේඛාවකින් ද ;

දකුණට සහ බස්නාහිරට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට ගම් ප්‍රදේශයේ දකුණු හා බටහිර සීමාවන් ඔස්සේ ඡන්ද කොට්ඨාශයේ උතුරු සීමාවේ ආරම්භක ලක්ෂ්‍ය දක්වා වයඹ දෙසට හා ඊසාන දෙසට ඇඳි රේඛාවකින් ද වේ.

| I වන තීරය | II වන තීරය |
|---|---|
| දනට පවත්නා ඡන්ද කොට්ඨාශ | අළුත් ඡන්ද කොට්ඨාශ |

**අංක 10 දරන ඡන්ද කොට්ඨාශය—වයවිල්**

උතුරට : මානල්පිඩ්ඩි පටුමග මධ්‍ය රේඛාවේ දිර්ඝ කිරීමක සිට ගම් ප්‍රදේශයේ බටහිර සීමාව දක්වා බටහිර දෙසටද, එකී රේඛාව හා මානල්පිඩ්ඩි පටුමග මධ්‍ය රේඛාව ඔස්සේ එය රවුම් පාර එක්වන මංසන්ධිය දක්වා නැගෙනහිර දෙසටද, එතැන් සිට එකී මධ්‍ය රේඛාව ඔස්සේ මුරුගමූර්ති කෝවිල් පටුමග මංසන්ධිවන ස්ථානය දක්වා උතුරු දෙසටද, එතැන් සිට එම පටුමග මධ්‍ය රේඛාව ඔස්සේ එය වෙට්ටිමඩම් පටුමග මංසන්ධි වන ස්ථානය දක්වා නැගෙනහිර දෙසටද දකුණ දෙසට හා නැවතත් නැගෙනහිර දෙසටද, එතැන් සිට කුඹුරු වෙල් යාය ඔස්සේ අදින ලද රේඛාවක් ඔස්සේ අංක 6 දරන ඡන්ද කොට්ඨාශයේ බටහිර සීමාව හමුවන තෙක් ගිණිකොන දෙසට හා නැගෙනහිර දෙසට ඇඳි රේඛාවකින් ද ;

නැගෙනහිරට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 6 දරන ඡන්ද කොට්ඨාශයේ බටහිර සීමාව ඔස්සේ එහි දකුණු කෙළවර දක්වා දකුණු දෙසට ඇඳි රේඛාවකින් ද ;

දකුණට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 9 දරන ඡන්ද කොට්ඨාශයේ උතුරු සීමාව ඔස්සේ බටහිර කෙළවර දක්වා බටහිර දෙසට ඇඳි රේඛාවකින් ද ;

බස්නාහිරට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට ගම් ප්‍රදේශයේ බටහිර සීමාව ඔස්සේ ඡන්ද කොට්ඨාශයේ උතුරු සීමාවේ ආරම්භක ලක්ෂ්‍ය දක්වා උතුරු දෙසට ඇඳි රේඛාවකින් ද වේ.

**අංක 11 දරන ඡන්ද කොට්ඨාශය—කරුකොලෙයි**

උතුරට : ගම් ප්‍රදේශයේ උතුරු සීමාවේ සිට එකී සීමාව ඔස්සේ අංක 8 දරන ඡන්ද කොට්ඨාශයේ බටහිර සීමාව හමුවන තෙක් ගිණිකොන දෙසට හා නැගෙනහිර දෙසටද ;

නැගෙනහිරට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 8 දරන ඡන්ද කොට්ඨාශයේ බටහිර සීමාව ඔස්සේ එහි දකුණු කෙළවර දක්වා දකුණු දෙසට ඇඳි රේඛාවකින් ද ;

දකුණට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 10 දරන ඡන්ද කොට්ඨාශයේ උතුරු සීමාව ඔස්සේ එහි බටහිර කෙළවර දක්වා බටහිර දෙසට ඇඳි රේඛාවකින් ද ;

බස්නාහිරට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට ගම් ප්‍රදේශයේ බටහිර සීමාව ඔස්සේ ඡන්ද කොට්ඨාශයේ උතුරු සීමාවේ ආරම්භක ලක්ෂ්‍ය දක්වා ඇඳි රේඛාවකින් ද වේ.

9–760/2

---

ඇල්.ජී.—බී. 27/39.

## ගම්සභා ආඥපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 5 වැනි වගන්තිය යටතේ, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු වැඩබලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාව.

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු වැඩ බලන ඇමති.

1970 .9.10 දින,
කොළඹ දීය.

### ආඥාව

1971 ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ, වඩමාරච්චි උතුර හා නැගෙනහිර සහ වඩමාරච්චි දකුණ හා බටහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශ තුළ පිහිටි උඩුපිඩ්ඩි ගම් ප්‍රදේශයේ සීමා, පොන්ඩයිමන්නාර් (122) ග්‍රාම සේවක කොට්ඨාශය, සහ 1970 මැයි මස 19 වැනි දින අංක 14,906/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවෙන් උඩුපිඩ්ඩි (121), කෙරුඩාවිල් (123), සහ පොලිකන්ඩි (126) යන ග්‍රාම සේවක කොට්ඨාශවල වැල්වෙට්ටිතුරේ නගර සභාවේ පාලන සීමාවට ඇතුළත් කොට ඇති කොටස් තත් ගම් ප්‍රදේශයෙන් ඉවත් කිරීමෙන් මෙයින් වෙනස් කර නැවත නිරූපණය කරනු ලැබේ.

9–760/3

---

## ගම්සභා ආඥපනත

(257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥ පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු වැඩබලන ඇමති විලියම් නීල් ද අල්විස් වන මම මෙම නිවේදනයෙන්—

(1) යාපනය දිස්ත්‍රික්කයේ සමහර ගම් ප්‍රදේශවල දනට පවත්නා ඡන්ද කොට්ඨාශ නව ඡන්ද කොට්ඨාශවලට අනු කොටස් කර බෙදීමට අදළව 1941 මැයි මස 23 වැනි දින අංක 8748 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය, එහි වූ උපලේඛනයේ '' උඩුපිඩ්ඩි ගම් ප්‍රදේශය '' යන ශිර්ෂය යටතේ වූ II වැනි ඡේදය—

(අ) අංක 9 දරන ඡන්ද කොට්ඨාශයේ සීමාවන් පිළිබඳ විස්තරය වෙනුවට මෙහි වූ ''අ'' උපලේඛනයේ සඳහන් විස්තර ආදේශ කිරීමෙන්ද ;

(ආ) අංක 10 දරන ඡන්ද කොට්ඨාශයට අදළ සියළුම විස්තර අත් හැරීමෙන් ද ;

(ඇ) අංක 12, 13 සහ 17 දරන ඡන්ද කොට්ඨාශවල සීමාවන් පිළිබඳ විස්තර වෙනුවට මෙහි ''ආ'' උපලේඛනයේ සඳහන් අංක 10, 11 සහ 15 දරන අළුත් ඡන්ද කොට්ඨාශවල විස්තර ආදේශ කිරීමෙන් ද ;

(ඈ) අංක 14, 15, 16, 18, 19, 20, 21, 22, 23 සහ 24 දරන ඡන්ද කොට්ඨාශ පිළිවෙලින් අංක 12, 13, 14, 16, 17, 18, 19, 20, 21, සහ 22 යනු වෙන් නැවත අංක යෙදීමෙන් ද ; මෙයින් සංශෝධනය කරමි.

(2) මෙම නිවේදනයේ (1) වැනි ඡේදයේ සඳහන් විධි විධාන—

(අ) එම විධිවිධාන, 1970 වර්ෂයේදී පැවැත්වීමට නියමිත ඉහත කී ගම් ප්‍රදේශයේ ගම් සභාවට සභිකයින් තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීම සම්බන්ධයෙන් වූ යම් කරුණකට අදළ වන ප්‍රමාණයට මේ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක විය යුතු බව ;

සහ

(ආ) එම විධිවිධාන වෙනයම් කරුණකට අදළ වන ප්‍රමාණයට මෙහි වූ දිනයේ උඩුපිඩ්ඩි ගම් සභාවේ නිල දරන සභිකයින්ගේ නිල කාලය අවසන් වන දිනයට ඉක්බිතිවම යෙදෙන දින සිට ක්‍රියාත්මක විය යුතු බව ප්‍රකාශ කරමි.

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලක, පළාත් පාලන හා ස්වදේශ කටයුතු වැඩ බලන ඇමති.

1970.9.10
කොළඹ දීය.

"අ" උපලේඛනය

අංක 9 දරන ඡන්ද කොට්ඨාශය—කපමුලෙයි—පහත සඳහන් පරිදි මායිම් වේ :

උතුරට :—වැල්වැටිතුරේ නගර සභාවේ අංක 9 දරන ඡන්ද කොට්ඨාශය වන මයිලියාතනෙයිහි දකුණු මායිම ;

නැගෙනහිරට :—වල්වෙට්ඩි ග්‍රාමයේ සහ පාරේ බටහිර සීමාව ;

දකුණට :—වීරාවිට් කුඹුරු ;

බටහිරට :—වීරාවිකුලම් කරා යන පටු මග.

"ආ" උපලේඛනය

අංක 12 දරන ඡන්ද කොට්ඨාශය—කෙරුඩාවිල් උතුර—පහත සඳහන් පරිදි මායිම් වේ ;

උතුරට :—කන්කසන්තුරෙයි—පේදුරුතුඩුව රජයේ වැඩ දෙපාර්තමේන්තු පාර ;

නැගෙනහිරට :—වැල්වෙටිතුරේ නගර සභාවේ අංක 9 දරන කොට්ඨාශය වන මයිලියාතනෙයිහි බටහිර සීමාව ;

දකුණට :—සේකන්ඩායි පටු මග සහ තලවායි පටු මග ;

බටහිරට :—කොන්ඩයිමනාර් ග්‍රාමයේ නැගෙනහිර මායිම.

අංක 13 දරන ඡන්ද කොට්ඨාශය—කෙරුඩාවිල් දකුණ—පහත සඳහන් පරිදි මායිම් වේ ;

උතුරට :—සේකන්ඩායි පටු මග සහ තලවායි පටුමග ;

නැගෙනහිරට සහ දකුණට :—තානක්කරකුරිච්චි ගමේ උතුර මායිම ;

බටහිරට :—වැල්වෙටිතුරේ නගර සභාවේ අංක 1 දරන ඡන්ද කොට්ඨාශය වන තොන්ඩයිමනාර්හි නැගෙනහිර සීමාව.

අංක 17 දරන ඡන්ද කොට්ඨාශය—පොලිකන්ඩි බටහිර—පහත සඳහන් පරිදි මායිම් වේ ;

උතුරට :—වැල්වෙටිතුරේ නගර සභාවේ දකුණු සීමාව ;

නැගෙනහිරට :—නවුන්ඩිල් රජයේ වැඩ දෙපාර්තමේන්තු පාර ;

දකුණට :—කොට්ටවට්ටෙයි ගම්මානයෙහි සෙම්පාඩු ;

බටහිරට :—වැල්වෙටිතුරේ නගර සභාවේ දකුණු මායිම.

9–760/4

---

ඇල්.-ඩී.—බී. 14/68.

නගර සභා ආඥාපනත

1967 අංක 2 දරන පනතින් සංශෝධිත (255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 10(2) වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු වැඩබලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

ෆීලික්ස් ද ආර් ඩයස් බණ්ඩාරනායක

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු වැඩ බලන ඇමති.

1970.9.10 වැනි දින,
කොළඹ දිය.

ආඥාව

තලවාකැලේ-ලිඳුල නගර සභාවේ දනට තිල දරන සභිකවරුන්ගේ නිල කාලය අවසන් විය යුතු දිනය වශයෙන් 1970 දෙසැම්බර් මස 31 වැනි දිනය වෙනුවට 1971 ජූනි මස 30 වැනි දිනය මෙයින් නියම කරනු ලැබේ.

9–760/5

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.